# 6 ශ්‍රේණිය ගණිතය

## 02 ඒකකය – 2022

## ස්ථානීය අගය



සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)


07 ශ්‍රේණිය පෙළ පොත අභ්‍යාස සහ පිළිතුරු ද ඒකකයට අදාළ ආදර්ශ ප්‍රශ්න පත්‍රයක් සහ පිළිතුරු ද අන්තර්ගත කර ඇත.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# 2 ස්ථානීය අගය

## 2.1 ස්ථානීය අගය

- සංඛ්‍යාවක එක් එක් ඉලක්කම පිහිටන ස්ථානය අනුව එම ඉලක්කමෙන් නිරූපණය වන අගයක් ඇත.
  උදා - 35 සංඛ්‍යාව සැලකූ විට




නිරූපණය වන අගය - 30

නිරූපණය වන අගය - 5

**2.1 අභ්‍යාසය**

(1) පහත දක්වා ඇති වගුව සම්පූර්ණ කරන්න.

| සංඛ්‍යාව | එකස්ථානයේ ඉලක්කම | දසස්ථානයේ ඉලක්කම | එකස්ථානයේ ඉලක්කමෙන් නිරූපණය වන අගය | දසස්ථානයේ ඉලක්කමෙන් නිරූපණය වන අගය |
|---|---|---|---|---|
| 63<br>76<br>40<br>88 | | | | |


## 2.1 අභ්‍යාසය


1. 63, 6, 3, 3, 60
2. 76, 7, 6, 6, 70
3. 40, 0, 4, 0, 40
4. 88, 8, 8, 8, 80



## 2.2 ස්ථානීය අගය නැවත මතක් කර ගැනීම (ස්ථානීය අගය සංඛ්‍යා අනුපිළිවෙළ)

- උදා - 67 524 සංඛ්‍යාව සැලකූ විට




✓ 4 පිහිටන්නේ ඒකස්ථානයේ වේ. 4න් නිරූපණය වන අගය 4 වේ.
✓ 2 පිහිටන්නේ දසස්ථානයේ වේ. 2න් නිරූපණය වන අගය 20 වේ.
✓ 5 පිහිටන්නේ සියස්ථානයේ වේ. 5න් නිරූපණය වන අගය 500 වේ.
✓ 7 පිහිටන්නේ දහස්ථානයේ වේ. 7න් නිරූපණය වන අගය 7000 වේ.
✓ 6 පිහිටන්නේ දස දහස්ථානයේ වේ. 6න් නිරූපණය වන අගය 60 000 වේ.

**2.2 අභ්‍යාසය**

(1) 99601 යන සංඛ්‍යාවේ,

(i) දකුණත කෙළවර සිට වම් අතට හතරවෙනියට යෙදී ඇති 9න් නිරූපණය වන අගය කීය ද?

(ii) 0 පිහිටි ස්ථානයට අදාළ ස්ථානීය අගය කීය ද?

(iii) 0න් නිරූපණය වන අගය කීය ද?

(iv) දකුණත කෙළවර සිට වම් අතට පස්වෙනියට යෙදී ඇති 9න් නිරූපණය වන අගය කීය ද?

(2) පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| සංඛ්‍යාව | ඉලක්කම | එම ඉලක්කම පිහිටන ස්ථානයේ නම | එම ඉලක්කමෙන් නිරූපණය වන අගය |
|---|---|---|---|
| 7940 | 9 | | |
| 8095 | 9 | | |
| 4568 | 5 | | |
| 1273 | 7 | | |
| 34856 | 5 | | |
| 94512 | 4 | | |
| 94512 | 5 | | |
| 19085 | 1 | | |
| 19085 | 0 | | |
| 5436 | 5 | | |

(3) 4, 5 සහ 8 යන එක් එක් ඉලක්කම එක්වරක් පමණක් යොදා ගනිමින් ලිවිය හැකි ස්ථාන තුනේ සංඛ්‍යා සියල්ල ලියන්න. එම එක් එක් සංඛ්‍යාවේ, 8 පිහිටි ස්ථානයට අදාළ ස්ථානීය අගය සහ 8න් නිරූපිත අගය ලියන්න.

(4) 2, 4, 5 සහ 9 යන එක් එක් ඉලක්කම එක්වරක් පමණක් යොදා ගනිමින් ලිවිය හැකි,

(i) ස්ථාන හතරේ විශාලතම සංඛ්‍යාව ලියන්න. එහි එක් එක් ඉලක්කමෙන් නිරූපණය වන අගය ලියන්න.

(ii) ස්ථාන හතරේ කුඩාතම සංඛ්‍යාව ලියන්න. එහි එක් එක් ඉලක්කමෙන් නිරූපණය වන අගය ලියන්න.

## 2.2 අභ්‍යාසය

1.
   I. 9 000
   II. 10
   III. 0
   IV. 90 000



2.

| | | |
|---|---|---|
| I. | සියස්ථානය | 900 |
| II. | දසස්ථානය | 90 |
| III. | සියස්ථානය | 500 |
| IV. | දසස්ථානය | 70 |
| V. | දසස්ථානය | 50 |
| VI. | දහස්ථානය | 4 000 |
| VII. | සියස්ථානය | 500 |
| VIII. | දස දහස්ථානය | 10 000 |
| IX. | සියස්ථානය | 0 |
| X. | දහස්ථානය | 5 000 |

3.

| | | | |
|---|---|---|---|
| I. | 458 | එකස්ථානය | 8 |
| II. | 485 | දසස්ථානය | 80 |
| III. | 548 | එකස්ථානය | 8 |
| IV. | 584 | දසස්ථානය | 80 |
| V. | 845 | සියස්ථානය | 800 |
| VI. | 854 | සියස්ථානය | 800 |



4.

I. 9542

| | | |
|---|---|---|
| 2 | එකස්ථානය | 2 |
| 4 | දසස්ථානය | 40 |
| 5 | සියස්ථානය | 500 |
| 9 | දහස්ථානය | 9000 |

II. 2459

| | | |
|---|---|---|
| 9 | එකස්ථානය | 9 |
| 5 | දසස්ථානය | 50 |
| 4 | සියස්ථානය | 400 |
| 2 | දහස්ථානය | 2000 |

## 2.3 සංඛ්‍යා කලාප

- විශාල සංඛ්‍යා කියවීමේ පහසුව සඳහා සංඛ්‍යා කාණ්ඩ වලට වෙන් කර ගනු ලැබේ. එහිදී ඒකස්ථානයේ සිට වම් අතට පිළිවෙළින් ස්ථාන තුන බැගින් වෙන් කරනු ලැබේ. උදා:

  50004454594

  50 004 454 594

- ඉහත ආකාරයට වෙන් කරන ලද කාණ්ඩයක්, සංඛ්‍යා කලාපයක් යනුවෙන් හඳුන්වනු ලැබේ. උදා:

| 50 | 004 | 454 | 594 |
|---|---|---|---|
| බිලියන කලාපය | මිලියන කලාපය | දහස් කලාපය | ඒකක කලාපය |

  - ➢ පනස් බිලියන හතර මිලියන හාරසිය පනස් හතර දහස් පන්සිය අනූ හතර

- සංඛ්‍යාවක් ඒකස්ථානයේ සිට වම් අතට මෙසේ ස්ථාන තුන බැගින් කාණ්ඩ කර ලිවීම, එම සංඛ්‍යාව සම්මත ආකාරයට ලිවීම ලෙස හැඳින්වේ.

- ක්‍රියාකාරකම 1

1. **63 465**
   - ✓ හැට තුන් දහස් හාරසිය හැට පහ.

2. **71 005**
   - ✓ හැත්තෑ එක් දහස් පහ.

3. **125 368**
   - ✓ එකසිය විසි පන් දහස් තුන්සිය හැට අට.

4. **300 300**
   - ✓ තුන්සිය දහස් තුන්සීය.

5. **2 178 525 348**
   - ✓ දෙබිලියන එකසිය හැත්තෑ අට මිලියන පන්සිය විසි පන් දහස් තුන්සිය හතළිස් අට.

6. **3 008 200**
✓ තුන් මිලියන අට සිය දහස් දෙසීය.

7. **7 250 000 20**
✓ හත් බිලියන දෙසිය පනස් මිලියන විස්ස.

8. **8 000 000 008**
✓ අට බිලියන අට.



### 2.3 අභ්‍යාසය

(1) පහත දක්වා ඇති එක් එක් සංඛ්‍යාව සම්මත ආකාරයෙන් ලියන්න.

(i) 72350 (ii) 55000 (iii) 27201125
(iv) 300001279 (v) 299000001 (vi) 21345699

(2) කලාපවලට වෙන් කර දක්වා ඇති, පහත දැක්වෙන සංඛ්‍යා අකුරින් ලියා දක්වන්න.

| | කලාපය | | | | සංඛ්‍යාව අකුරින් |
|---|---|---|---|---|---|
| | බිලියන | මිලියන | දහස් | ඒකක | |
| (i) | 10 | 040 | 500 | 000 | |
| (ii) | 4 | 750 | 050 | 000 | |
| (iii) | 1 | 010 | 100 | 500 | |
| (iv) | 75 | 004 | 350 | 050 | |

(3) පහත දක්වා ඇති සංඛ්‍යා යොදා ගෙන වගුව සම්පූර්ණ කරන්න.

(i) 76735 (ii) 864657 (iii) 2769812 (iv) 47867619
(v) 763156561 (vi) 6746971256 (vii) 276523164515

## 2.3 අභ්‍යාසය

1.
   I. **72 350** ✓
   II. **55 000** ✓



III. 272 011 125
IV. 3 000 012 279
V. 299 000 001
VI. 21 345 699

2.

I. දස බිලියන හතළිස් මිලියන පන්සිය දහස
II. හතර බිලියන හතසිය පනස් මිලියන පනස් දහස.
III. එක් බිලියන දස මිලියන සියක් දහස් පන්සියය.
IV. හැත්තෑපන් බිලියන හතර මිලියන තුන්සිය පනස් දහස් පනහ

| සංඛ්‍යාව | කලාපය | | | | සංඛ්‍යාව අකුරින් |
|---|---|---|---|---|---|
| | බිලියන | මිලියන | දහස් | ඒකක | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

(4) පහත දක්වා ඇති එක් එක් සංඛ්‍යාව සම්මත ආකාරයට ලියා, සංඛ්‍යා නාමය ද ලියා දක්වන්න.

(i) 50800435000 (ii) 43050800500 (iii) 585000430
(iv) 300001283 (v) 299000003 (vi) 272000023
(vii) 100200030000 (viii) 553000000 (ix) 47000005

(5) පහත අකුරින් දක්වා ඇති එක් එක් සංඛ්‍යාව සම්මත ආකාරයට ලියන්න.

(i) හාරසිය පන් දහස (ii) තුන්සිය විසිපන් දහස් පන්සියය
(iii) හතර මිලියන අටසිය දහස (iv) හය බිලියන හැට මිලියනය
(v) දහඅට මිලියන විසි හතර දහස් පනහ

3.

| සංඛ්‍යාව | බිලියන | මිලියන | දහස් | ඒකක | අකුරින් |
|---|---|---|---|---|---|
| 76735 | | | 76 | 735 | හැත්තෑ හය දහස් හත්සිය තිස් පහ |
| 864657 | | | 864 | 657 | අටසිය හැට හතර දහස් හයසිය පනස් හත |
| 2769812 | | 2 | 769 | 812 | දෙමිලියන හත්සිය හැට නව දහස් අටසිය දොළහ. |
| 47867619 | | 47 | 867 | 619 | හතළිස් හත් මිලියන අටසිය හැට හත් දහස් හයසිය දහ නවය. |
| 763156561 | | 763 | 156 | 561 | හත්සිය හැට තුන් මිලියන එකසිය පනස් හය දහස් පන්සිය හැට එක. |
| 6746971256 | 6 | 746 | 971 | 256 | හය බිලියන හත්සිය හතළිස් හය මිලියන නවසිය හැත්තෑ එක් දහස් දෙසීය පනස් හය |
| 276523164515 | 276 | 523 | 164 | 515 | දෙසීය හැත්තෑ හය බිලියන පන්සිය විසි තුන් මිලියන එකසිය හැට හතර දහස් පන්සිය පහළොව |

4.

I. 50 800 435 000
   - ✓ පනස් බිලියන අටසිය මිලියන හාරසිය තිස් පන් දහස

II. 43 050 800 500
   - ✓ හතළිස් තුන් බිලියන පනස් මිලියන අටසිය දහස් පන් සියය

III. 585 000 430
   - ✓ පන්සිය අසූ පන් මිලියන හාරසිය තිහ

IV. 300 001 283

✓ තුන්සිය මිලියන එක් දහස් දෙසීය අසූ තුන

V. 299 000 003

✓ දෙසීය අනූ නව මිලියන තුන

VI. 272 000 023

✓ දෙසීය හැත්තෑ දෙමිලියන විසි තුන

VII. 100 200 030 000

✓ එකසිය බිලියන දෙසීය මිලියන තිස් දහස

VIII. 553 000 000

✓ පන්සිය පනස් තුන් මිලියනය


IX. 4 700 000 542

✓ හතර බිලියන හත්සිය මිලියන පන්සිය හතළිස් දෙක

5.

I. 405 000
II. 325 500
III. 4 800 000
IV. 6 060 000 000
V. 18 024 050

(6)




පෘථිවිය හා සූර්යයා අතර දුර කිලෝමීටර 149597870කි. මෙම සංඛ්‍යාව සම්මත ආකාරයෙන් ලියා අකුරින් ලියන ආකාරය ද ලියා දක්වන්න.

(7) ව්‍යාපාරිකයකු රුපියල් 15006500 ක මුදලක් බැංකුවක තැන්පත් කිරීමට යයි. ඔහු බැංකු පෝරමයක එම මුදල අකුරින් ලියා දැක්විය යුත්තේ කෙසේ ද?

6. 149 597 870

✓ එකසිය හතළිස් නව මිලියන පන්සිය අනූ හත් දහස් අටසිය හැත්තෑව

7. 15 006 500

✓ පහළොස් මිලියන හය දහස් පන්සියය

## මිශ්‍ර අභ්‍යාසය

(1) මෙහි දක්වා ඇති එක් එක් සංඛ්‍යාව, නිදසුනේ දැක්වෙන ආකාරයට ස්ථානීය අගය ඇසුරෙන් විහිදුවා ලියන්න.

**නිදසුන**

6745 = 1000 ඒවා 6 + 100 ඒවා 7 + 10 ඒවා 4 + 1 ඒවා 5

(i) 24 (ii) 40 (iii) 546 (iv) 7163 (v) 92651

(2) පහත වගුව සම්පූර්ණ කරන්න.

| | සංඛ්‍යාව | ඉලක්කම | එම ඉලක්කම පිහිටන ස්ථානයේ නම | එම ඉලක්කමෙන් නිරූපණය වන අගය |
|---|---|---|---|---|
| (i) | 80 341 | 3 | | |
| (ii) | 64 592 | 9 | | |
| (iii) | 200 450 | 2 | | |
| (iv) | 185 340 | 8 | | |
| (v) | 4 500 000 | 4 | | |

(3) 8, 6, 5, 3 සහ 1 යන ඉලක්කම්වලින්, එක් ඉලක්කමක් එක් වරක් පමණක් යොදාගනිමින් ලිවිය හැකි ස්ථාන හතරේ,

(i) විශාලතම සංඛ්‍යාව ලියන්න. එහි 3න් නිරූපණය වන අගය ලියන්න.

(ii) කුඩාතම සංඛ්‍යාව ලියන්න. එහි 3න් නිරූපණය වන අගය ලියන්න.

(4) පහත දක්වා ඇති එක් එක් සංඛ්‍යාව සම්මත ආකාරයට ලියා, ඒවා කියවන ආකාරය ද ලියා දක්වන්න.

(i) 450050 (ii) 37504537 (iii) 212345699

(iv) 8432109640 (v) 2003040050 (vi) 143021000

(5) එකිනෙකට වෙනස් වූ ඉලක්කම් තුනක් භාවිතයෙන් ලිවිය හැකි, අවසන් කලාපය මිලියන කලාපය වන කුඩාතම සංඛ්‍යාව කුමක් ද? එම සංඛ්‍යාව අකුරින් ද ලියා දක්වන්න.

(6) අවසන් කලාපය බිලියන කලාපය වන විශාලතම සංඛ්‍යාව කුමක් ද? එම සංඛ්‍යාව අකුරින් ද ලියා දක්වන්න.

## මිශ්‍ර අභ්‍යාසය

1.

I. 24 = 10 ඒවා 2 + 1 ඒවා 4
II. 40 = 10 ඒවා 4 + 1 ඒවා 0
III. 546 = 100 ඒවා 5 + 10 ඒවා 4 + 1 ඒවා 6
IV. 7 163 = 1000 ඒවා 7 + 100 ඒවා 1 + 10 ඒවා 6 + 1 ඒවා 3
V. 92 651 = 10000 ඒවා 9 + 1000 ඒවා 2 + 100 ඒවා 6 + 10 ඒවා 5 + 1 ඒවා 1

2.

| | | | | |
|---|---|---|---|---|
| I. | 80 341 | 3 | සියස්ථානය | 300 |
| II. | 64 592 | 9 | දසස්ථානය | 90 |
| III. | 200 450 | 2 | සියක් දහස්ථානය | 200 000 |
| IV. | 185 340 | 8 | දස දහස්ථානය | 80 000 |
| V. | 4 500 000 | 4 | මිලියනස්ථානය | 4 000 000 |

3.

I. 8 653 - 3
II. 1356 - 300

4.

I. 450 050 - හාරසිය පනස් දහස් පනහ
II. 37 504 537 - තිස් හත් මිලියන පන්සිය හතර දහස් පන්සිය තිස් හත
III. 212 345 699 - දෙසිය දොළොස් මිලියන තුන්සිය හතළිස් පන් දහස් හයසිය අනූ නවය
IV. 8 432 109 640 - අට බිලියන හාරසිය තිස් දෙමිලියන එකසිය නව දහස් හයසිය හතළිහ.
V. 2 003 040 050 - දෙබිලියන තුන් මිලියන හතළිස් දහස් පනහ
VI. 143 021 000 - එකසිය හතළිස් තුන් මිලියන විසි එක් දහස

5. 1 000 023 – එක් මිලියන විසි තුන.

6. 999 999 999 999 – නවසිය අනූ නව බිලියන නවසිය අනූ නව මිලියන නවසිය අනූ නව දහස් නවසිය අනූ නවය.

## ව්‍යවහාරයේ පවතින වෙනත් නාම

| | | |
|---|---|---|
| ✓ 100 000 | සියක් දහස | ලක්ෂය |
| ✓ 1 000 000 | මිලියනය | දස ලක්ෂය |
| ✓ 10 000 000 | දස මිලියනය | කෝටිය |
| ✓ 100 000 000 | සියක් මිලියනය | දස කෝටිය |

## පාරිභාෂික වචනමාලාව

| | |
|---|---|
| ✓ දහස | - Thousand |
| ✓ මිලියනය | - Million |
| ✓ බිලියනය | - Billion |
| ✓ ඒකක කලාපය | - Unit Zone |
| ✓ දහස් කලාපය | - Thousands zone |
| ✓ මිලියන කලාපය | - Millions zone |
| ✓ බිලියන කලාපය | - Billions zone |



# 2 ස්ථානීය අගය


- **නිපුණතාව 1** - එදිනෙදා ජීවිතයේ අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම සඳහා තාත්වික සංඛ්‍යා කුලකය තුළ ගණිත කර්ම හසුරුවයි.
- **නිපුණතා මට්ටම 1.1** - සංඛ්‍යාවල ප්‍රමාණාත්මක අගය විමර්ශනය කරයි.
- **ඉගෙනුම් පල** -
  - සංඛ්‍යාවක එක් එක් ඉලක්කමේ ස්ථානීය අගය හඳුනා ගනියි.
  - බිලියනය කලාපය තෙක් සංඛ්‍යා කියවයි.
  - බිලියනය කලාපය තෙක් සංඛ්‍යා වචනයෙන් හා ඉලක්කමෙන් ලියයි.
  - බිලියන කලාපය තෙක් සංඛ්‍යා කියවීම හා ලිවීම ආශ්‍රිත ගැටලු විසඳයි.

## ගුරුවරයාට අදහසක්



- 4 ශ්‍රේණිය සඳහා අපේක්ෂිත නිපුණතා යටතේ 1000 තෙක් සංඛ්‍යාවල ස්ථානීය අගය ද,5 ශ්‍රේණිය සඳහා අපේක්ෂිත නිපුණතා යටතේ 10000 තෙක් සංඛ්‍යාවල ස්ථානීය අගය පිළිබඳ අන්තර්ගත වේ.
- ඒකක, දහස්, මිලියන හා බිලියන කලාප නාම පිළිවෙලින් මතක තබා ගැනීමේ අවශ්‍යතාව පැහැදිලි කිරීම වැදගත් වේ.
- සංඛ්‍යා ලිවීමේ දී, කියවීමේ පහසුව සඳහා කලාප වෙන් කර ඇති බව අවධාරණය කරන්න.
- සම්මත ආකාරයෙන් සංඛ්‍යා කියවීමට හා ලිවීමට අමතරව ව්‍යවහාරයේ පවත්නා වෙනත් නාමකරණයන් ද භාවිත කරයි. විශේෂයෙන් ලක්ෂය හා කෝටිය යන අගය ඇතුළත් සංඛ්‍යා, නිවැරදි ව සම්මත ආකාරයට කියවීම හා ලිවිම කෙරෙහි විශේෂ අවධානය යොමු කරන්න.

## ඉගෙනුම් පල



- සංඛ්‍යාවක එක් එක් ඉලක්කමෙහි ස්ථානීය අගය හඳුනා ගනියි.

❖ මේ සඳහා ක්‍රියාකාරකම් දෙකක් පහතින් දැක්වේ.

6 ශ්‍රේණිය ගණිත ගුරු මාර්ගෝපදේශය - පිටු අංක 30,31 කෙරෙහි අවධානය යොමු

## ක්‍රියාකාරකම 01

### ගුණාත්මක යෙදවුම්

කණ්ඩායමකට-

- රු.1, රු.10 ආදර්ශ මුදල් කාසි හා රු.100 , රු.1000 ආදර්ශ මුදල් නෝට්ටු 9 බැගින්
- මුදල් අගය පෙතේ ඡායා පිටපතක් (ඇමුණුම 2.1)

### ගුරු කාර්යය

- සිසුන් ක්‍රියාකාරකමට සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- එක් එක් කණ්ඩායමට රු.1, රු.10 ආදර්ශ මුදල් කාසි හා රු.100 ආදර්ශ මුදල් නෝට්ටු 9 බැගින් ද, මුදල් අගය පෙත (ඇමුණුම 2.1) හා ඇමුණුම 2.2 හි සඳහන් වගුවේ පිටපත් සෑම ශිෂ්‍යයකුට ම ලබා දෙන්න.
- රු.425ක මුදල පහත දක්වා ඇති අයුරින් මුදල් අගය පෙතේ ආදර්ශ මුදල් නෝට්ටු තබා නිරූපණය කිරීමට සිසුන් යොමු කරවන්න.

| රු.100 ඒවා | රු.10 ඒවා | රු.1 ඒවා |
|---|---|---|
|  |  |  |

- එම අගය ඇමුණුම 2.2හි සඳහන් වගුවේ ඉලක්කමින් ලියා ඇති අයුරු සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- 4, 2 හා 5 ඉලක්කම්වල වෙන වෙන ම නිරූපිත වටිනාකම් සිසුන්ගෙන් විමසන්න.
- මුදලේ වටිනාකම ස්ථානීය අගය අනුව සලකමින් නිරූපණය කරන අයුරු සිසුන් සමඟ සාකච්ඡා කරමින් විවිධ මුදල් ප්‍රමාණ (රු.999ට අඩු) යොදාගෙන මෙය දස වතාවක් පමණ කරන්න.

### සිසු කාර්යය

- ඔබට ලබා දී ඇති ආදර්ශ මුදල් නෝට්ටු හා කාසි ඇසුරින් ගුරුවරයා පවසන මුදල් ප්‍රමාණය මුදල් පෙතෙහි නිරූපණය කරන්න.
- එම අගය, ඉලක්කමින් ඔබට ලැබුණු වගුවේ ලියා දක්වන්න.

## ක්‍රියාකාරකම 02


### ගුණාත්මක යෙදවුම්

කණ්ඩායමකට-

- බොක්ස් බෝඩ් ,ගම්, අල්පෙනෙති දෙකක්
- ඇමුණුම 2.3හි සඳහන් වෘත්ත දෙක හා ඊතලය  (ඡායා පිටපත්)

### ගුරු කාර්යය

- ඇමුණුම 2.3හි වෘත්ත 2 හා ඊතලය කපා බොක්ස් බෝඩ් කැබැල්ලක අලවා කපා වෙන් කර ගන්න. (ඡායා පිටපත් භාවිත කරන්න)
- සුදුසු ප්‍රමාණයේ බොක්ස් බෝඩයක රූපයේ දැක්වෙන පරිදි වෘත්ත ආස්තර දෙක කරකැවිය හැකි පරිදි කේන්ද්‍රයෙන් අමුණා ගන්න. වෘත්ත දෙක මැදින් ඊතලය සවි කරන්න. එම වෘත්ත දෙක A හා B ලෙස නම් කරන්න.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර සෑම කණ්ඩායමකට ම උපකරණ කට්ටලය බැගින් ලබා දෙන්න.
- A හා B වෘත්ත ආස්තර දෙක ම එකවර කරකවා දර්ශකය මඟින් පෙන්වන දත්ත (ඇමුණුම 2.4) වගුවේ ඇතුළත් කිරීමට සිසුන් යොමු කරවන්න.
- එක් ශිෂ්‍යයෙකුට උපකරණය ක්‍රියාකරවීමේ අවස්ථා දෙකක් ලැබෙන පරිදි සෑම ශිෂ්‍යයෙකුට ම අවස්ථාව සලස්වන්න.
- තනි තනිව වගුව පිරවීමට සෑම ශිෂ්‍යයෙකු ම යොමු කරවන්න. (ඇමුණුම 2.4 හි ඡායා පිටපත් සෑම ශිෂ්‍යයෙකුට ම එක බැගින් ලබා දෙන්න.)




A

B

## සිසු කාර්යය

- සපයා ඇති ඉගෙනුම් ආධාරකයේ වෘත්තාකාර ආස්තර දෙක එකවර කරකවන්න.
- ඊ හිස දර්ශකයේ A වෘත්තයේ පෙන්වන ස්ථානීය අගය සහ B වෘත්තයේ ඉලක්කම් ඇමුණුම 2.4හි වගුව සම්පූර්ණ කරන්න.

## ඉගෙනුම් පල

- බිලියනය කලාපය තෙක් සංඛ්‍යා කියවයි.
- බිලියනය කලාපය තෙක් සංඛ්‍යා වචනයෙන් හා ඉලක්කමෙන් ලියයි.
- බිලියන කලාපය තෙක් සංඛ්‍යා කියවීම හා ලිවීම ආශ්‍රිත ගැටලු විසඳයි.

❖ මේ සඳහා ක්‍රියාකාරකමක් පහතින් දැක්වේ.

## ක්‍රියාකාරකම 01

## ගුණාත්මක යෙදවුම්

එක් කණ්ඩායමකට

- කලාප නාම තුන සඳහන් කාඩ්පත් හා 0-9 තෙක් අංක සඳහන් කාඩ්පත් (ඇමුණුම 2.5 හි දැක්වෙන) කට්ටල 4 බැගින්
- සංඛ්‍යා සටහන් කිරීමේ වගුව (ඇමුණුම 2.6)

## ගුරු කාර්යය

**කාර්යය 01**

- ශිෂ්‍යයින් ක්‍රියාකාරකමට සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- ඇමුණුම 2.5හි ඇති කලාප නාම සඳහන් කාඩ්පත් හා ඉලක්කම් (0-9) සඳහන් කාඩ්පත් කට්ටල 4 බැගින් කණ්ඩායම්වලට ලබා දෙන්න.
- දහස් කලාප නාම සඳහන් කාඩ්පත දෙපසින් සපයා ඇති ඉලක්කම් සහිත කාඩ්පත් 3 බැගින් තබා එම සංඛ්‍යාව කණ්ඩායමේ සෑම ශිෂ්‍යයකුට ම කියවීමට අවස්ථාව ලබා දෙන්න.

උදා -

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2 | 5 | 1 | දහස් | 3 | 6 | 7 |

**'දෙසිය පනස් එක් දහස් තුන්සිය හැටහත '**

## ගුරු කාර්යය තවදුරටත්

- ඉලක්කම් මාරු කරමින් නැවත නැවත සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- මිලියන කලාප නාම සඳහන් කාඩ්පත වම් පසින් තබා, ඊට ඉදිරියෙන් ඉලක්කම් සහිත කාඩ්පත් 3ක් තබා එය කියවීමට සිසුන් යොමු කරන්න.
- සෑම කණ්ඩායමකින් ම සකස් කරගත් සංඛ්‍යාවක් පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.

උදා -

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2 | 5 | 1 | මිලියන | 5 | 5 | 1 | දහස් | 3 | 6 | 7 |

**'දෙසිය පනස් එක් මිලියන පන්සිය පනස් එක් දහස් තුන්සිය හැටහත'**

- මේ ආකාරයට බිලියන කලාපය තෙක් සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.

**කාර්යය 02**

- සිසුන් සංඛ්‍යා කියවීමට හුරු වූ පසු, පෙර ක්‍රියාකාරකමෙහි නැවත යෙදෙමින් ඇමුණුම 2.3 හි සපයා ඇති වගුව සම්පූර්ණ කිරීමට සිසුන් යොමු කරන්න.

## සිසු කාර්යය

**කාර්යය 01**

- ඔබට ලබා දී ඇති කලාප නාම සඳහන් කාඩ්පත් අතුරින් දහස් කලාපය පමණක් යොදා ගනිමින් දෙපසට කැමති පරිදි සපයා ඇති ඉලක්කම් සහිත කාඩ්පත් 3 බැගින් තබා එම සංඛ්‍යාව කියවන්න.
- කණ්ඩායමේ සෑම ශිෂ්‍යයෙකුට ම අවස්ථාව දෙමින්, මිලියන කලාපය සහ බිලියන කලාපය සඳහා ද මෙසේ කරමින් ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.
- ඔබ කණ්ඩායමෙන් සකස් කළ එක් සංඛ්‍යාවක් පන්තියට ඉදිරිපත් කරන්න.

**කාර්යය 02**

- නැවත ක්‍රියාකාරකමෙහි යෙදෙමින් සකස් කරගත් සංඛ්‍යාව සපයා ඇති වගුවේ ඉලක්කමින් හා වචනයෙන් සටහන් කරන්න.
- ක්‍රියාකාරකම අවසානයේ අභ්‍යාස 2.3 හා මිශ්‍ර අභ්‍යාස කරන්න.

ඇමුණුම 2.1

මුදල් අගය පෙත

| 100 ඒවා | 10 ඒවා | 1 ඒවා |
|---|---|---|
| | | |

ඇමුණුම 2.2


මුදල් අගය පෙතේ පෙන්නුම් කරන අගයන් භාවිත කරමින් සම්පූර්ණ කරන්න.

| | 100 ඒවා | 10 ඒවා | 1 ඒවා | සංඛ්‍යාව ඉලක්කමෙන් | සංඛ්‍යා නාමය |
|---|---|---|---|---|---|
| 1 | 4 | 2 | 5 | 425 | හාරසිය විසි පහ |
| 2 | | | | | |
| 3 | | | | | |
| 4 | | | | | |
| 5 | | | | | |
| 6 | | | | | |
| 7 | | | | | |
| 8 | | | | | |
| 9 | | | | | |
| 10 | | | | | |




A







B

ඇමුණුම 2.4

A හා B වෘත්ත කර කැවිමින් ලබා ගන්නා දත්ත භාවිත කර සම්පූර්ණ කරන්න.

| A වෘත්තය | B වෘත්තය | ස්ථානීය වටිනාකම |
|---|---|---|
| දහයස්ථානය | 3 | 30 |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |



| | | |
|---|---|---|
| බිලියන | 0 | 1 |
| දහස් | 2 | 3 |
| මිලියන | 4 | 5 |
| | 6 | 7 |
| | 8 | 9 |

| සංඛ්‍යාව ඉලක්කමින් | | | | | | | | | | | | සංඛ්‍යාව වචනයෙන් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |

6 ශ්‍රේණිය | ගණිතය | ඒකකය : 2 - ස්ථානීය අගය

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1) මෙම සංඛ්‍යා ඉලක්කම් භාවිතයෙන් ලියන්න.

i) නවසිය පනස් දෙදහස -

ii) අටසිය දහස් පන්සිය පනහ -

iii) තිස්පන් දහස් හාරසිය අට -

2) පහත දැක්වෙන සංඛ්‍යා ගණක, රාමුවල දක්වන්න.

34 532 80 008 178 022

3) පහත සංඛ්‍යා සඳහා ව්‍යවහාරයේ පවතින වෙනත් නාම ලියන්න.

සියක් දහස - 100 000 -

...................................................................

මිලියනය - 1 000 000 -

...................................................................

දස මිලියනය - 10 000 000 -

...................................................................

සියක් මිලියනය- 100 000 000 -

...................................................................

4) සාමාන්‍ය ආකාරයට ඇති සංඛ්‍යා සම්මත ආකාරයට ලියන්න.

285347 -

107174165 -

5) $7645 = 7 \times 1000 + 6 \times 100 + 4 \times 10 + 5 \times 1$

ඉහත නිදසුනක් ආකාරයට පහත දැක්වෙන සංඛ්‍යා ස්ථානීය අගය ඇසුරෙන් විහිදුවා ලියන්න.

1) 2025 -

2) 10 6674 -

3) 465 -

4) 376001 -

6) පහත දැක්වෙන සංඛ්‍යා සම්මත ආකාරයට ලියා ඒවා කියවන ආකාරයට ද ලියන්න.

545001 -

34743215 -

308307305 -

7) 5, 8, 0, 3 ඉලක්කම් හතරම භාවිතයෙන් ලිවිය හැකි විශාලතම සංඛ්‍යාව හා කුඩාතම සංඛ්‍යාව ලියන්න.

8) පහත සඳහන් සංඛ්‍යා ඉලක්කමෙන් ලියන්න.

1) දෙමිලියන අටසිය හැට දෙක

2) විසි පන් දහස් එක

3) එක් මිලියන එකසිය දෙදහස

9) පහත සංඛ්‍යා කලාපවලට වෙන්කර ලියන්න.

1201338 -

35005407 -

215493200 -

10) ඉහත සංඛ්‍යා අකුරින් ලියන්න.

*සැකසුම : නයනා අසෝකා මිය*

# පිළිතුරු




Answer

**1.**


- **I.** **952 000**
- **II.** **800 550**
- **III.** **35 408**

**2.**


- **I.** **34 532**




- **II.** **80 008**



III. 178 022




3.

| | | | |
|---|---|---|---|
| I. | 100 000 | සියක් දහස | ලක්ෂය |
| II. | 1 000 000 | මිලියනය | දස ලක්ෂය |
| III. | 10 000 000 | දස මිලියනය | කෝටිය |
| IV. | 100 000 000 | සියක් මිලියනය | දස කෝටිය |

4.

I. 285347 - 285 347

II. 107174165 - 107 174 165

5.

I. 2025 = 1000 ඒවා 2 + 100 ඒවා 0 + 10 ඒවා 2 + 1 ඒවා 5

II. 106 674 = 100000 ඒවා 1 + 10000 ඒවා 0 + 1000 ඒවා 6 + 100 ඒවා 6 + 10 ඒවා 7 + 1 ඒවා 4

III. 465 = 100 ඒවා 4 + 10 ඒවා 6 + 1 ඒවා 5

IV. 376 001 = 100000 ඒවා 3 + 10000 ඒවා 7 + 1000 ඒවා 6 + 100 ඒවා 0 + 10 ඒවා 0 + 1 ඒවා 1

6.

I. 545 001 – පන්සිය හතළිස් පන් දහස් එක.

II. 34 743 215 – තිස් හතර මිලියන හත්සිය හතළිස් තුන් දහස් දෙසිය පහළොව.

III. 308 307 305 – තුන්සිය අට මිලියන තුන්සිය හත් දහස් තුන්සිය පහ.

**7.**

- ✓ විශාලතම සංඛ්‍යාව – 8530
- ✓ කුඩාතම සංඛ්‍යාව – 3058

**8.**

I. 2 000 862

II. 25 001

III. 1 102 000

**9.**

I. 1 201 338

II. 35 005 407

III. 215 493 200

**10.**

I. එක් මිලියන දෙසිය හතළිස් එක් දහස් තුන්සිය තිස් අට.

II. තිස් පන් මිලියන පන් දහස් හාරසිය හත.

III. දෙසිය පහළොස් මිලියන හාරසිය අනූ තුන් දහස් දෙසිය.



අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප 3in1 Youtube නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

**ස්තූතියි !**

**හසිත හෙට්ටිආරච්චි**
**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**

ඔබට අවශ්‍ය සියළුම Past Papers, Model Papers, Term test Papers, Short notes Text Book, Teacher's Guide ආදී සියළුම දේ නොමිලේ ලබා ගැනීමට www.pastpaperszone.lk අපගේ වෙබ් අඩවියට පිවිසෙන්න

3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ